**19**

# මග

## රත්න ශ්‍රී විජේසිංහ (1953)

මහගමසේකරගෙන් පසු කවිය හා ගීතය අරබයා පුළුල් නිර්මාණ දායකත්වයක් සැපයූ 70, දශකයේ කාව්‍ය නිර්මාණ ක්ෂේත්‍රයට අවතීර්ණ ව 80 දශකයේ දී ඉස්මතු වූ ප්‍රබල කවියෙකු ලෙස රත්න ශ්‍රී විජේසිංහ සැලකිය හැකි ය. කවිය හුදු මනෝභාව නිරූපණයෙන් ඔබ්බට ගමන් ගත්, සමකාලීන සමාජ යථාර්ථය නිරූපණය කිරීමෙහි මෙවලමක් බවට පත්කරගත් රත්න ශ්‍රී, ලාංකේය සමාජ දේහය පරිණත දෘෂ්ටියකින් නිරූපණය කරන කවියෙකි. නව කවියෙහි දෘශ්‍යමය අවකාශය පුළුල් කිරීම, නව්‍ය ආකෘති, ප්‍රස්තුතයට උචිත භාෂා භාවිතය හා වඩා පෘථුල වූ අන්තර්ගතයක් කවියට හඳුන්වාදීම රත්න ශ්‍රී විජේසිංහගේ කවියේ විශේෂතා වෙයි.

1979 දී **'බිය නොවන් අයියණ්ඩි'** නම් කාව්‍ය සංග්‍රහය ඔස්සේ කාව්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වූ මොහු **වස්සානේ** (1985) **සුබ උදෑසන** (1988) **සල් ගහ යට** (1996) **තරු ලකුණ** (1997) **මධ්‍යම යාමය** (2005) **සන්ධ්‍යා තීර්ථය** (2010) හා **තිකිණි** වැස්ස (2012) යන කාව්‍ය සංග්‍රහ ප්‍රකාශයට පත් කොට තිබේ.

80 දශකයේ පුරෝගාමී කවියෙකු වූ මොහු සිංහල කාව්‍ය ක්ෂේත්‍රයට මෙන් ම සිංහල ගීත ක්ෂේත්‍රයට වඩා ප්‍රබල නිර්මාණ දායකත්වයක් සැපයූ ගී පද රචකයෙකි. පරිභෝජනවාදී ආර්ථිකය



අභිමුව ආතතිය හා තරගකාරිත්වය මත දිවි ගෙවන මානව ජීවිතවල භෞතික හා ආධ්‍යාත්මික යථාර්ථයත් මානව ප්‍රේමය ප්‍රමුඛ සකලවිධ පුද්ගල සබඳතාත් ඔහුගේ තියුණු විමසුමට ලක් වෙයි. ප්‍රචාරකවාදී ප්‍රවණතා අන්තර්ගත කලාවෙහි නිමග්න නොවුව ද සමාජ සාධාරණත්වය පිළිබඳ ගැඹුරු හා පෘථුල දේශපාලන දෘෂ්ටියක් මොහුගේ නිර්මාණ වෙතින් ප්‍රකට වෙයි. සම්භාව්‍ය සාහිත්‍ය තුළින් ලත් ශික්ෂණයක් ජන සාහිත්‍යයෙන් උකහාගත් හෘදග්‍රාහී බවත් එක්තැන් වූ සංයමශීලී ප්‍රබල කවියෙකු ලෙස මොහු සහෘදයාට සමීප වෙයි.

මඟක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මඟක් ම යි
අතර මඟ ළත නොවී
මුව දෙර සොයා යන
ගඟක් ම යි

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

මඟකට දෙසක් නොකියන්
නැත ඊට තිසි කාරණා

අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා

මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

## ලිඛිත අභ්‍යාස

1. 'මග' කවි පෙළෙන් ජීවිතයට ඉස්මතු කෙරෙන ජීවිත දෘෂ්ටිය පිළිබඳ පැහැදිලි කරන්න.
2. කාව්‍යාලංකාර භාවිතයෙ දී කවියා දක්වා ඇති දක්ෂතාව 'මග' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.